**රජයේ නිවේදන**

**සුරාබදු ආඥාපනත**

**අංක 02/2022 දරන සුරාබදු නිවේදනය**

**වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, බැසිල් රාජපක්ෂ වන මා විසින් මෙම නිවේදනය මඟින් 2017 දෙසැම්බර් මස 11 වන දින අංක 2049/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1004 දරන සුරාබදු නිවේදනයේ 1 වන උප ලේඛනයේ අයිතම අංක 7, 8, 10, 13 සහ 15 (ii) වෙනුවට පහත උපලේඛනය 2021 ජනවාරි 01 වන දින සිට 2022 මාර්තු 31 දින දක්වා ක්‍රියාත්මක වන ලෙස පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

2021 ජනවාරි මස 01 දිනැති අංක 2208/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 02/2021 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 01 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1 වන උපලේඛනය

| I වැනි තීරුව | | II වැනි තීරුව | |
|---|---|---|---|
| බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 7 | හෝටල් බලපත්‍රය (ර.බී. 7) සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 05 හෝ ඊට වැඩි<br>(i) කාමර 200 ක් හෝ ඊට වැඩි<br>(ii) කාමර 20 සිට199 දක්වා<br>(iii) කාමර 20 අඩු | <br><br><br>-<br>-<br>- | <br><br><br>25,000<br>25,000<br>25,000 |
| 8 | හෝටල් පියීකා බලපත්‍රය (ර.බී. 8) | - | - |
| 10 | භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමැතිය සහිත/ අනුමැතිය රහිත) (ර.බී. 11) | - | 25,000 |
| 13 | තානායම් බලපත්‍රය (ර.බී. 12) | - | 25,000 |
| 15 | ii. ස්ථානීය පරිභෝජනය (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත/ අනුමැතිය රහිත) | - | 25,000 |